# ආඬියාගල ප්‍රදේශය ආශ්‍රිත ජල උල්පත්වලින් නිර්මාණය වූ පැරණි වැව් කිහිපයක් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කරුණාරත්න බී.එම්.එස්.ඊ,[1] සේනානායක එස්.එම්.අයි.එන්,[2] කුමාරි යු.බී.පී.එන්.එස්[3]**

ඉපැරණි මානව නිර්මාණයන් අතරින් උත්තුංග සේවයක් කරන තාක්ෂණික මෙවලමක් ලෙස වාරි කර්මාන්තය පෙන්වාදිය හැකිය. ඈත අතීතයේ මුතුන් මිත්තන්ගේ ශික්ෂණ විද්‍යාත්මක උරුමයක් ලෙස වාරි තාක්ෂණය බිහි විය. ලාංකීය වාරි ශිෂ්ටාචාරය අතර නුවර කලාවිය වැව් අමුණු ප්‍රධාන තැනක් ගනී. එනම් ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාවකට උරුමකම් කියන ජාතියක් වෙසෙන හෙළයන්ගේ දීපයක් වූ බැවිනි. උල්පත් ආශ්‍රිතව බිහි වූ වැව් විශාල ප්‍රමාණයක් පලාගල කොට්ඨාසයේ ආඬියාගල ප්‍රදේශය ආශ්‍රිතව දක්නට හැකි වේ. මේ අනුව අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කහල්ල, පරවහගම, උපුල්වැහැර ප්‍රදේශයන් තුළ නිර්මාණය වී ඇති උල්පත් ආශ්‍රය කරගත් වැව් තුනක් පවතී. එම වැව් ලෙස කහල්ල උල්පතේ වැව, උපුල්වෙහෙර උල්පතේ වැව, දල්පත කපුවාගම වැව යනාදි වැව් පෙන්වාදිය හැකිය. වාරි පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ න්‍යායාත්මක තත්ත්වය ප්‍රායෝගික ආකාරයෙන් ක්‍රියාත්මක කර ඇති ආකාරය හා එහි තාක්ෂණය කෙබඳු ද? ඒ ආශ්‍රිතව පවතින උරුම වටිනාකම් සොයා බැලීම මෙම අධ්‍යනයේ මූලික අරමුණ ලෙස පෙන්වාදිය හැකිය. මේ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ යොදාගත් අතර අධ්‍යන ක්ෂේත්‍රය ලෙස යොදාගත් ආඬියාගල ග්‍රාමයේ වැඩිහිටියන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදි. මෙම අධ්‍යනයේ දී සොයාගත් කරුණු අතර උල්පත් ජලයෙන් පෝෂණය වන වැව් මඟින් සැදුම්ලත් එල්ලංගා පද්ධතියේ තාක්ෂණික ක්‍රමවේද, ජනප්‍රවාද ඉතා වැදගත් වේ. වාරි පුරාවිද්‍යාවේ න්‍යායාත්මක තත්ත්වය මෙම ග්‍රාමීය ප්‍රදේශ සඳහා කෙබඳු ආකාරයට බලපෑවේද යන්න මෙම අධ්‍යනය සිදු කිරීමේ දී අවබෝධ විය. ආඬියාගල ග්‍රාමයේ ජනතාවගේ උල්පත් ආශ්‍රිතව ඇති වී තිබෙන විශ්වාසයන් පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය. මෙම අධ්‍යයනය තුළින් අවධානය යොමු වූයේ ආඬියාගල ප්‍රදේශයේ ජනතාව කොතෙක් දුරට උල්පත් පරිහරණය කරන්නේ ද විශ්වාසයන් ග්‍රාමීය ප්‍රදේශ අතර ව්‍යාප්ත කළේ කෙසේද යන්න අධ්‍යනය කිරීමේ දී නව්‍යකරණයත් සමඟ උල්පත් ජලය පරිහරණය කිරීම අවම වූ බැවින් එම වැව් පද්ධති නඩත්තු කිරීම පවා සිදු නොකළ බැව් පෙන්වාදිය හැකිය. මේ නිසා වැව් පද්ධතියම පරිහානියට ලක් වී ඇති බැව් දක්නට හැකි විය. මේ තුළින් පෙන්වාදිය හැකි නිගමනය වන්නේ ජනගහනයේ සාක්ෂරතාවය වැඩිවත්ම එදා පැවති ජන විඥානය මුළුමනින් ම විනාශ මුඛයට පත් වී ඇති බවයි.

**මුඛ්‍ය පද ;** උල්පත් එල්ලංගාපද්ධතිය, ජනප්‍රවාද, තාක්ෂණය, වැව්

[1,2,3] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
2017shashini@gmail.com